රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 128

මගේ අංකය: 2/9/759(එච්).
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
පිළිබඳ අමාත්‍යාංශය,
සිදෙසේ මැදුරගුය,
කොළඹ 7. 1978 ඔක්තෝබර් මස 2 දින.

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන් සහ
දෙපාර්තමේන්තු ප්‍රධානයන් වෙත.

"රාජ්‍ය සංස්ථා"යන යෙදුමෙහි නිර්වචනය – ශ්‍රී ලංකා
ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ
~~XXII~~ වැනි පරිච්ඡේදය.

මෙම අමාත්‍යාංශය විසින් මින්මතු නිකුත් කෙරෙන චක්‍රලේඛයන්හි "රාජ්‍ය සංස්ථා" යන යෙදුම භාවිතා කළවිට ඉන් අදහස් වන්නේ සමාගම් ආඥා පනත යටතේ හැර වෙනත් යම්කිසි ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ හෝ පිහිටුවන ලද්දාවූ හෝ පිහිටුවනු ලබන්නාවූ ද, ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නාවූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් බව සැලකුව මැනවි.

මේ සම්බන්ධයෙන් නිකුත් කළ අංක.113 හා 77.10.27 දින දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය මෙයින් අවලංගු වේ.

අ.ත/ ඩී.බී.අයි.පී.එස්. සිරිවර්ධන
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු
අමාත්‍යාංශයේ ලේකම්.

අතිරේක ආයතන අධ්‍යක්ෂ